පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 489

ආයතනයේ නම - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நாடாளுமன்ற வெளியீட்டுத் தொடர் எண் – 489

நிறுவனத்தின் பெயர் - கட்டிடம் துறை

நாடாளுமன்றத்தின் பொதுக் கணக்குகள் குழுவால் தாக்கல் செய்யப்பட்ட அறிக்கைகள் மீது, நிலை ஆணை எண் 119(4)-இன் கீழ் மாண்புமிகு அமைச்சர் அவர்களால் எடுக்கப்பட்ட கருத்துக்களையும் நடவடிக்கைகளையும் நாடாளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்.

Parliament Series No 489

Name of the institution – Department of Building

Submission of observation of Hon.Minister and steps taken with regard to the reports tabled by the committee on Public Accounts in terms of Standing Order No.119(4).

පාර්ලිමේන්තු මාලාව අංක 489

ආයතනයේ නම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

	කමිටුව විසින් ලබා දුන් නිර්දේශ	නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වත්මන් තත්වය
01.	<u>ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සහ පවතින පුරප්පාඩු</u>	ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ සමස්ථ අනුමත තනතුරු සංඛ්‍යාව 638 ක් වන අතර 2026.04.30 දින වන විට ඉන් තනතුරු 466 ක් සම්පූර්ණ කර නිබුණි.
02.	<u>ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්යභාරය</u> ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයක් වන වාර්ෂිකව සකස් කරනු ලබන "ගොඩනැගිලි ගාස්තු උපලේඛනය (BSR)" දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පලකළ පමණින් එම මිල ගණන් ඉදිකිරීම් කටයුතු වලදී අදාළ කර ගැනීමට අනෙකුත් රාජ්‍ය ආයතනවලට අනිවාර්ය නෛතික බලපෑමක් නොමැති බැවින් සාමාන්‍යයෙන් අනෙකුත් රාජ්‍ය ආයතන එම මිල ගණන් භාවිතා නොකරන බව අනාවරණය කර ගත් කාරක සභාව, මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ද මැදිහත් වීම සහිත කමිටුවක් පත් කර ගොඩනැගිලි ගාස්තු උපලේඛනයෙන් වාර්ෂිකව ලබා දෙන්නා වූ මිල ගණන් සිය ඉදිකිරීම් කටයුතු වලදී අනිවාර්යයෙන් අදාළ කර ගත යුතු බවට සියලු රාජ්‍ය ආයතන දැනුවත් කර ඒ මගින් ගොඩනැගිලි ගාස්තු උපලේඛනයට නෛතික වලංගුභාවයක් ලබා දෙන ලෙසත්, එම කටයුත්ත සඳහා මේ වන විට සියලුම පළාත් සභා විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාවලිය අධ්‍යයනය කර සුදුසු ක්‍රමවේදයක් සකසන ලෙසත්, ප්‍ර.ග.නි සහ ග.නි වෙත නිර්දේශ කර එම කමිටුවේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත ලබා දෙන ලෙසට ප්‍ර.ග.නි. වෙත නිර්දේශ කරන ලදී. තවද, ගොඩනැගිලි ගාස්තු උපලේඛනය යාවත්කාලීන කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යභාරයක් වන බැවින් ඒ සඳහා විශේෂ අවධානය යොමුකර මෙම වසරට අදාළ ගොඩනැගිලි ගාස්තු උපලේඛනය වහාම දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පලකරන ලෙස ග.නි වෙත නිර්දේශ කරන ලදී.	2026.01.20 වන දින නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 26/0013/827/002 මගින් "ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන ගොඩනැගිලි ගාස්තු උපලේඛණය (BSR), මධ්‍යම රජයට අයත් ආයතන විසින් ගොඩනැගිලි ආශ්‍රිත ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේදී පදනම වශයෙන් භාවිත කිරීම" සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් අංක MUDCH/HC-EN/ES/8/4 හා 2026.03.10 දිනැති චක්‍රලේඛය මගින්, මධ්‍යම රජය යටතට ගැනෙන සියලු ආයතනයන්හි ගොඩනැගිලි හා සම්බන්ධ කටයුතු වලදී ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී පදනම ලෙස ගොඩනැගිලි ගාස්තු උපලේඛණය (BSR) භාවිතා කළ යුතු බවට සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කර ඇත. අදාළ ආයතන සඳහා යාවත්කාලීන කරන ලද ගොඩනැගිලි ගාස්තු උපලේඛණය (BSR) ලබා දීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් දැනටමත් ආරම්භ කර ඇත.
03.	<u>කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් පවතින අක්‍රමිකතා</u> 2014 වසරේදී අසාදු ලේඛනගත කළ යුතු බවට නිර්දේශ නිකුත් කළ කොන්ත්‍රාත්කරුවන් එලෙස	2014 වසරේදී අසාදු ලේඛනගත කළ යුතු බවට රාජ්‍ය ගිණුම් කාරක සභාව නිර්දේශ නිකුත් කර තිබුණේ

	අසාදු ලේඛණගත නොකිරීම එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරන ලද බරපතල වරදක් බව තීරණය කළ කාරකසභාව, එම අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ වන විට විශ්‍රාම ගොස් සිටියද ඉදිරි කාරක සභාවකදී අවශ්‍ය වුවහොත් ඔහුගෙන් මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට සිදු වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් වහාම කාරක සභාව වෙත ලබා දෙන ලෙසත් ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදී.	2007 වර්ෂයේදී විජයකමල් කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු. 19,429,416.30 (VAT රහිත) ප්‍රදානය කර තිබූ පේරාදෙණිය එළවළු බීජ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2008 වර්ෂයෙදී දුර්වල ප්‍රගතිය හේතුවෙන් අතරමග අත්හිටුවීම හා සම්බන්ධවයි. මෙහිදී කොන්ත්‍රාත්කරු සමඟ තිබූ ගිවිසුම ඇවර කිරීමේදී කොන්ත්‍රාත්කරුගේ බිල්පත් මඟින් අඩුකර ගැනීම් සිදුකර තිබූ අතර කාර්ය සාධන බැඳුම්කරය හා අත්තිකාරම් බැඳුම්කරය මුදල් කර ගැනීමට අදාළ රක්ෂණ ආයතනය පැහැර හැර තිබිණි. එය කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් තොර කාරණයකි. අදාළ රක්ෂණ ආයතනය වෙතින් බැඳුම්කරය හා අත්තිකාරම් බැඳුම්කරයෙහි මුදල් අය කර ගැනීම සඳහා ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් විසින් 2012.04.19 වන දිනැති ලිපිය මඟින් නීතිපති දෙපාර්තමේන්තුවේ සහය පතන ලදී. ඒ අනුව නීතිපති තුමා විසින් MBSL රක්ෂණ සමාගම හා විජයකමල් කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනයට එදිරිව 2018 වර්ෂයේදී කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇත. (නඩු අංක 4789/2019/DMR). ඒ යටතේ පළමු නඩු විභාගය 2024.07.12 දින ආරම්භ විය. මෙම නඩුවේ වගඋත්තරකාර ආයතනය වන අදාළ රක්ෂණ ආයතනය සමඟ මෙම නඩු විභාගය සමථයකට පත් විය හැකිද යන්න පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව විසින් විමසා ඇත (2025.08.15 දිනැති ලිපිය අනුව). ඒ අනුව, ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒ සඳහා එකඟ බව අදාළ රක්ෂණ ආයතනය වෙත දැනුම් දී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස කාර්යසාධන බැඳුම්කරය සඳහා රු. 972,000.00 ක් හා අත්තිකාරම් බැඳුම්කරය සඳහා රු. 2,185,000.00 ක් ලෙස රු. 3,157,000.00 ක මුදලක් චෙක්පත් අංක 043973 හා 2026.02.26 දිනැති ලංකා බැංකුවේ චෙක්පත මඟින් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් තුමා වෙත ඉදිරිපත් කර ඇත. තවද, රේඛීය අමාත්‍යාංශ ලේකම්තුමා විසින් 2024.10.09 දිනැති ලිපිය මඟින් කමිටුවක් පත්කර මේ පිළිබඳ අධ්‍යනය කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් 2024.11.12 දිනැති ලිපිය මඟින් එම කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇති අතර එම ආයතනය අසාදු ලේඛණ ගත කළ නොහැකි බව කමිටුව විසින් නිර්දේශ කර ඇත.

04.	**2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතට අනුව සභාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික නිකුත් කිරීමේ ප්‍රමාදයන් පැවතීම.** සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් අසම්පූර්ණ ලේඛණ ඉදිරිපත් කිරීමේ ගැටළුව විසඳීම සඳහා, මින් ඉදිරියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලිපිලේඛණ භාරගැනීමේදී ඒ සඳහා නිශ්චිත අයදුම්පතක් සහ මාරගෝපදේශයක් සකස් කර ගන්නා ලෙස කාරකසභාව විසින් අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ග.නි වෙත නිර්දේශ කළේය.	පිරික්සුම් ලැයිස්තු හා මාර්ගෝපදේශ සකස් කර ඇතත් පනත බලාත්මක කරන තුරු සහතික නිකුත් කිරීමේ හැකියාවක් නොමැත.
05.	2021 – 2025 වර්ෂ වෙනුවෙන් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම (Corporate Plan) ප්‍රකාරව ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තයේ තාක්ෂණයන්හි ජාත්‍යන්තර ප්‍රමිති අඛණ්ඩව වෙනස් වීම තක්සේරු කිරීම සහ අමුද්‍රව්‍ය, ශ්‍රමය ආදිය පිළිබඳව ශ්‍රී ලංකා සම්මතයන් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මේ වන විට ගෙන ඇති පියවරයන්	2024 තෙවන කාර්තුවේ සිට 2026 වර්ෂයේ පළමු කාර්තුව අවසානය දක්වා කාලය තුළ ගොඩනැගිලි ගාස්තු උපලේඛනය සඳහා අලුතින් අයිතම සැලකිව යුතු ප්‍රමාණයක් ඒවායෙහි විශ්ලේෂණ සම්පාදනයෙන් පසුව, එක් කෙරිණි.
06.	ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සතුටුදායක තත්ත්වයක නොපැවතීම සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, කාරකසභාව විසින් ස්ථාපිත ලකුණු ලබාදීමේ දත්ත පද්ධතියේ අවම ලකුණු ලබා ගත් ආයතනයක් බවට පත්වී තිබීම	කාරකසභාව විසින් ස්ථාපිත ලකුණු ලබාදීමේ දත්ත පද්ධතියට අනුව 2024 වර්ෂය සඳහා ආයතනය විසින් සපයන ලද තොරතුරු මගින් 87.5 ක ලකුණු සංඛ්‍යාවක් ලබා තිබුණි.
07.	**විගණකාධිපතිවරයාගේ 2024.07.23 දිනැති කෙටි සටහනෙහි ඇතුළත් අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රගතිය**	*(2014 සැප්තැම්බර් 09 වන දින පවත්වන ලදරාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ලබාදී තිබුණු නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය)*
	නියෝග අංක 10 **විගණන නිරීක්ෂණය-** ඉදිකිරීම් කටයුතුවල නිරත නාගරික සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ රාජ්‍ය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වැනි රාජ්‍ය ආයතන කීපයක්ම පවතින බැවින් එම කාර්යයන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින්ද සිදු කරන බැවින් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති වෙනස් කිරීම පිළිබඳ හැකියාව සොයා බැලීම. දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති වෙනස් කිරීම පිළිබඳව හැකියාව සොයාබලා නොතිබුණි.	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මේ වන විට අඩු ක්‍රියාකාරී මට්ටමක පවතී. නාගරික සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි උපදේශන සපයන ආයතනයක් ලෙස ක්‍රියා කළද රජයේ ගොඩනැගිලි නවීකරණය හා නඩත්තුව පිළිබඳව කටයුතු කිරීම සිදු කරන බවට පැහැදිලි සාක්ෂි නොමැත. රජයේ ගොඩනැගිලි නඩත්තුව, නවීකරණ කටයුතු සිදු කිරීම හා ගොඩනැගිලි ඉදිකිරීම යන සියලු කරුණු අරමුණු කරගෙන පිහිටුවා ඇති ආයතනයක් ලෙස ඉදිකිරීමකදී අපේක්ෂා කරන ඉහළ ප්‍රමිතිය හා මූල්‍ය වගවීම සහතික කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතුව විරස්ථිත ක්‍රමවේදයක් පවතී.

		කෙසේ වෙතත් උක්ත ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය, අමාත්‍ය මණ්ඩල අනු කාරක සභාවේදී සලකා බලා එම අනුකාරක සභාවට ගරු ජනාධිපතිතුමාගේ අදහස් දැක්වීමට අනුව අමාත්‍යාංශ ලේකම් වෙත කරන ලද නියමයට අනුව යමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් කමිටුවක් පත්කර අනුමැතිය සඳහා යොමු කර ඇත. **රේඛීය අමාත්‍යාංශය නියෝජනය කිරීම සඳහා කමිටුවට අතිරේක සාමාජිකයින් දෙදෙනෙකු ඇතුළත් කිරීමට පසුව තීරණය කර ඇත.**
	නියෝග අංක 10 (අ) **විගණන නිරීක්ෂණය -** පසුගිය වසර 05 ක (2019 සිට 2023 දක්වා) කාර්යය මණ්ඩලය 476 සිට 502 දක්වා එනම් සියයට 5 කින් වර්ධනයවී තිබීම සහ රු.මි. 500කට අධික පුනරාවර්තන වියදම් වාර්ෂිකව දැරුවද ප්‍රතිසංස්කරණ හා නව ඉදිකිරීම් ව්‍යාපෘති මූල්‍ය කාර්යසාධනය රු. මිලියන 4,811 සිට රු. මිලියන 1,614 දක්වා එනම් සියයට 66 කින් පහත වැටී තිබුණි.	කාර්යය මණ්ඩලය වැඩිවීම මත පුනරාවර්තන වියදම් වැඩිවීම සිදු වේ. නමුත් එම කාරණය ව්‍යාපෘතීන්හි මූල්‍ය කාර්ය සාධනය අඩු වැඩි වීම කෙරෙහි සෘජු සම්බන්දයක් නොමැත. රටෙහි පවතින මූල්‍ය ස්ථාවරත්වය හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ වරින් වර රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ යනාදිය ඉදිකිරීම් ව්‍යාපෘති මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි බලපායි. තවද 2020 වර්ෂයේ ඇතිවූ 'කොවිඩ්' වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා තැබීම හා ඉන්පසු ඇති වූ ආර්ථික අර්බුදය ව්‍යාපෘතියෙහි ප්‍රගතිය අඩුවීම කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරනු ලැබිණි.
	නියෝග අංක 10 (ආ) **විගණන නිරීක්ෂණය -** දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා ලංසු ඇගයීමේදී අදාල ලංසුකරුවන් විසින් ආයතනය තුල පෙර සිදුකරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් දිගින් දිගටම ප්‍රමාද වීම, කාර්යය ඉටු නොකර අතරමැද අතහැර දමා ගිවිසුම් අවලංගු කිරීම සහ කාර්ය සාධන සුරක්ෂණ මුදල් කර ගැනීමට නිර්දේශවූ කොන්ත්‍රාත්කරුවන් වෙත ද අසාදු ලේඛණගත කිරීමෙන් තොරව දිගින් දිගටම කොන්ත්‍රාත් පැවරීම සිදු කරන අවස්ථා නිරීක්ෂණය විය.	2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛන ගත කිරීමට රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාට බලය පවරා ඇත. ඒ අනුව කටයුතු කිරීමට 2025 වර්ෂයේ සිට වාර්තා වන අසාර්ථක ලංසුකරුවන් පිළිබඳව නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයෙහි ලේකම්වරයා වෙත දැනුම් දීමට කටයුතු සූදානම් කර ඇත.
	නියෝග අංක 10 (ඇ) **විගණන නිරීක්ෂණය -** දෙපාර්තමේන්තුව වෙත වසර 4ක් තුළ පිරිනමන ලද ව්‍යාපෘති 23ක් නිම කිරීමෙන් තොරව අතරමග නවතා දමා තිබුණි.	2024.10.31 වන විට වැඩ සිදු කරමින් පැවති මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමෙහි ව්‍යාපෘතිය වෙනුවෙන් 2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැත. කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයෙහි නිලධාරී නිවස්නයක් ඉදිකිරීමෙහි ව්‍යාපෘතියෙහි ඉතිරි ඉදිකිරීම් වැඩ දැනට සිදු කෙරෙමින් පවතී. ව්‍යාපෘතීන් 04 ක වැඩ අවසන් කර හාරදී ඇත.

		වැඩ අවසන් නොකළ ව්‍යාපෘතීන් 17 ක වගකීම අදාළ සේවාදායක ආයතන සතු වේ. 2025 වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මෙම ව්‍යාපෘති සම්බන්ධව වගකීමක් පැවරී නොතිබිණි.
	නියෝග අංක 10 (ඇ) **විගණන නිරීක්ෂණය** - විධිමත් හා යාවත්කාලීන කොන්ත්‍රාත් ලේඛනයක් ප්‍රධාන කාර්යාලයේ පවත්වා නොතිබුණි.යොමුව 2022-1.6.1(ඇ)	ප්‍රධාන කාර්යාලයේ කොන්ත්‍රාත් ශාඛාව මගින් පවත්වා ගෙන යන ලිපි ගොනුවල කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රසම්පාදන කටයුතු හා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීම දක්වා වූ තොරතුරු පවත්වා ගනු ලබයි. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් අනතුරුව, ඉදිරියට සිදු කර ගෙන යන කටයුතු හා අදාළ කාර්යය අවසන් කිරීම දක්වා වූ තොරතුරු ව්‍යාපෘතිය අයත් කලාප කාර්යාලයේ පවත්වා ගෙන යනු ලබන ලිපිගොනුවල අඩංගු වේ. (ප්‍රාදේශීය කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන Contract Payment Register හි වැඩිමනත් තොරතුරු අඩංගු වේ) මෙයට අමතරව ප්‍රධාන කාර්යාලයේ සැලසුම් අංශය මගින් පිළියෙළකර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මාසික ප්‍රගති වාර්තාවෙහි කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් පසු ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු අඩංගු වේ.
	නියෝග අංක 10 (ඉ) විගණන නිරීක්ෂණය - මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු ඒවායෙහි ඉදිකිරීම් කටයුතු කරගනු පිණිස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේදී ලබා දෙනු ලැබූ රු.මිලියන 1,335 ක් වූ ප්‍රතිපාදනයන්ගෙන් රු.මිලියන 644 ක් එනම් ප්‍රතිපාදිත මුදලින් 48% ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඉතිරි රු.මිලියන 691ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එය මුළු ප්‍රතිපාදනයෙන් 52% ක් වේ. මේ තුල මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකළ ව්‍යාපෘති 09 ක් පවතින අතර එහි මුළු ප්‍රතිපාදනයෙහි වටිනාකම රු.මිලියන 312 ක් විය.	වෙනත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු ඒවායෙහි ඉදිකිරීම් කටයුතු කරගනු පිණිස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේදී ලබා දෙනු ලැබූ රු.1,335,896,343.15 ක් වූ ප්‍රතිපාදනයන්ගෙන් රු.644,102,933.59 ක් වියදම් කර ඉතිරි මුදල අදාළ ආයතන වෙත නැවත පවරා දී ඇත.
	03. 2020, 2021 විගණකාධිපති වාර්තාවල ඇතුලත් කරුණු හා වර්තමාන කාර්යසාධනය සමාලෝචනය	
	(අ) නිරීක්ෂණය - මුදල් රෙගුලාසි 789 ප්‍රකාරව සාමාන්‍ය නියමය වනුයේ රජයේ සියළුම නිර්මාණ හා වැඩ ක්‍රියාත්මක කිරීම පිළිබඳව රජයේ වැඩ දෙපාර්තමේන්තුව (ගොඩනැගිලි දෙපාර්තමේන්තුව) වගකිව යුතු බවයි.	මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති අංක BD/CBP/01/01/04-2022 හා 2022.04.26 චක්‍රලේඛය ප්‍රකාරව අනුව අඩු ප්‍රගතියක් පෙන්වන හෝ ඉදිකිරීම් නවතා දමන ලද වැඩ රජයට හා කොන්ත්‍රාත්කරුවන්ට අගතියක් නොවන පරිදිත් දිගුකාලීන පැවැත්ම තහවුරුවන පරිදිත් අවශ්‍යම කොටස් නිමකිරීමට උපදෙස් ලැබී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිවල විෂයපථය

		සීමාකර ගිවිසුම් අවසන් කරන ලදී. එසේ නොවුනහොත් කොන්ත්‍රාත්කරුවන් වැඩ නතර කරන කාලය සඳහා විවිධ හිමිකම් ඉදිරිපත්කර රජයට විශාල වැය බරක් දැරීමට සිදුවනු ඇත. ඒ අනුව කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව අදාල කටයුතු සිදු කර ඇත.
	(ආ) **නිරීක්ෂණය** - දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් පිළිබඳව යාවත්කාලීන වූ වාර්තාවට අනුව ඉඩම් 45කින් ඉඩම් 12කට පමණක් ඔප්පු පවතින අතර ඉතිරි ඉඩම් 33 සඳහා හිමිකම් ඔප්පු නොමැත. මෙයින් ඉඩම් 27ක සහ එහි ඇතුලත් ගොඩනැගිලි 43 තක්සේරු වටිනාකම සඳහන් නොවීය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම්වල සඳහන් ඉඩම් වටිනාකම්හි නිරවද්‍යතාවය තහවුරු නොවීය. යොමුව 2021(3.2)ඇ	ඉඩම් 45න් මේ වන විට ඉඩම් 18ක් සඳහා ඔප්පු /පැවරුම් සහතික ලබාගෙන ඇත. ඉතිරි ඉඩම් 27 සඳහා ඔප්පු / පැවරුම් සහතික ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.
	(ඇ) **නිරීක්ෂණය** දියතලාව පොලිසිය අසල පිහිටි තක්සේරු වටිනාකම රු. මිලියන 10.55 ක්වූ ඉඩම සහ නිල නිවාසය ප්‍රධාන ඉංජිනේරු (Kandy II) මගින් බදුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දී ඇති නමුත් එය බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් භාවිතයට නොගන්නා බැවින්, එම දේපළ දිස්ත්‍රික් කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා නැවත දෙපාර්තමේන්තුවට පවරා ගන්නා ලෙස 2017.04.11 දින අංක 12-06-64 දරන ලිපිය මගින් මහනුවර ප්‍රධාන ඉංජිනේරු විසින් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත. නමුත් මේ සම්බන්ධ ලිපිගොනු පරීක්ෂා කිරීමේදී මෙම පවරාදීම සම්බන්ධව තොරතුරු සොයාගත නොහැකි විය. යොමුව 2021(3.2)ඇ	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇති, දියතලාව නගර මධ්‍යයේ පිහිටි ඉඩම වෙනුවට හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 64 එච් ජයමිණිපුර ග්‍රාම නිලධාරී වසමේ ඇල්ල අලුත්වෙල ගමේ පිහිටා ඇති අ.ග.පි 387හි කැබලි අංක 1899 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1517 ක් වූ ඉඩම් කොටසෙහි පැවරුම් සහතික ලබා ගත හැකි බව හපුතලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2026.05.27 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.
	(ඈ) **නිරීක්ෂණය** - තංගල්ල සංචාරක බංගලාව පසුගිය වසර 02ක කාලය තුළ අමුත්තන් සඳහා වෙන් කිරීම සිදු නොවූ බව දන්වා ඇතත් ජල ගාස්තු හා විදුලි ගාස්තු අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණි	2024-12-01 දින සිට අමුත්තන් වෙනුවෙන් නවාතැන් පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.
	(04) වර්තමාන කාර්යසාධනය පිලිබඳ වැදගත් කරුණු	
	(අ) මු.රෙ.571(3)ප්‍රකාරව ඉකුත් වූ සියලුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කල යුතු වුවත් 2023දෙසැම්බර් 31 දින වන විට එසේ නිරවුල් නොකරන ලද වර්ෂ 02 ට වැඩි ශේෂය රු.මිලියන 218ක් විය. මීට අමතරව ඉදිකිරීම් අවසන් කර දෝෂ නිවැරදි කිරීමේ කාලයද (Defects Liability period) අවසන් වී දීර්ඝ කාලයක් ගතවී තිබුණද නිවැරදි කළ යුතු දෝෂ නිවැරදි නොකිරීම හේතුවෙන් සහ අතරමග නවතා දමා තිබූ ව්‍යාපෘති වලට අදාලව නිරවුල් නොකළ රැඳවුම් මුදල්	2023.12.31 දිනට 13/52 පොදු තැන්පත් ගිණුමේ වසර දෙක ඉක්මවූ ශේෂ වටිනාකම රු.109,630,767.08 ක් වූ අතර එම ශේෂ අතරින් රු.37,784,822.31 ක් 2025.10.15 දින වන විට රජයේ ආදායමට බැර කළ අතර ඉන් වසර දෙක ඉක්ම වූවද තවදුරටත් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා 2024.01.01 සිට 2025.10.15 දක්වා නිදහස් කළ මුදල රු. 38,141,413.95 කි. ව්‍යාපෘති 09 ක රු.20,940,042.62 ක ශේෂයක් නැවත සේවාදායක ආයතන වෙත ආපසු ලබා දී ඇත. එසේම වසර දෙක

	සහ නියමිත කාර්යසාධනයක් නොවීම හේතුවෙන් නවතා දැමූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 06ක් සඳහා තබා තිබූ වටිනාකම රු.මිලියන 36.13 ක් වූ කාර්යසාධන සුරක්ෂණයන් 2023වර්ෂයේදී මුදල් කර එම මුදල් ද තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.රාජ්‍ය ආයතන වෙතින් භාරගනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා පිළියෙල කරනු ලබන ඇස්තමේන්තු අගයන් හා කොන්ත්‍රාත් ප්‍රදානය කරනු ලබන අගයන් අතර විශාල පරතරයක් පවතින අතරම සේවාදායකයාගෙන් අදාල ඇස්තමේන්තුගත අගයම එකවර මුදලින් ලබාගෙන පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන වසර ගණනාවක් යන තුරුත් ශේෂයන් නොපියවා පැවතුණි. යොමුව (2023 අවසන් වාර්තාවේ 1.6.2)	ඉක්ම වූවද තව දුරටත් ව්‍යාපෘති ක්‍රියාත්මක බැවින් ආදායමට හෝ සේවාදායක ආයතන වෙත මුදා හැරිය නොහැකි ව්‍යාපෘති අංක BD-458/ZWS/21 දරණ කම්කරු දෙපාර්තමේන්තුවේ එක් ව්‍යාපෘතියක් පමණක් ඇති අතර එහි ශේෂය 12,764,488.20 කි. මු.රෙ.570(ආ) ප්‍රකාරව ව්‍යාපෘති තැම්පතු සම්බන්ධයෙන් ව්‍යාපෘතිය අවසන් වූ දින සිට වසර 02 ක කාලයක් රඳවා ගැනීමට හැකියාව ඇත. 2023.12.31 දිනට 16/33 රැඳවුම් මුදල්ගිණුමේ වසර දෙක ඉක්ම වූ ශේෂ වටිනාකමරු.108,376,808.87 ක් වූ අතර එම ශේෂ අතරින් රු.40,237,753.59 ක් 2025.09.30 වනවිට රජයේ ආදායමට බැර කළ අතර, රු.17,285,238.83 ක ශේෂයක් නැවත සේවාදායක ආයතන වෙත ආපසු ලබාදුන් අතර 13/52 ගිණුමට මාරු කළ ශේෂ වටිනාකම 3,151,269.64 කි. වසර දෙක ඉක්මවූවද තවදුරටත් ව්‍යාපෘති ක්‍රියාත්මක බැවින් ආදායමට හෝ සේවාදායක ආයතන වෙත මුදා හැරිය නොහැකි ව්‍යාපෘති 72 කට අදාළ තැන්පත් ශේෂය 47,702,546.81 කි
	(ආ)දේපල පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික නිකුත් කිරීම.	බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතෙහි කාලය ඉක්මවා ඇති බැවින් මෙම පනත නැවත බලාත්මක වීමෙන් පසු කොන්දේසිවලට යටත්ව ආරක්ෂණ සහතික නිකුත්කිරීමට හැකියාව ඇත.

වෛද්‍ය සුසිල් රණසිංහ
අමාත්‍ය
නිවාස ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය